# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1879/20 - 2014 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාදා - 2014.09.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව**

(නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, මගී ප්‍රවාහන, වතු සුහසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් කටයුතු අමාත්‍යාංශය)

2014 අංක 02 දරන සබරගමුව පළාතේ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය

2014.07.22 දින සබරගමුව පළාතේ පළාත් සභාවේ ගරු සභාපතිතුමා විසින් සහතිකය සටහන් කරන ලදී.

2014.08.06 දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලදී.

සබරගමුව පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව**

***2014 අංක 02 දරන සබරගමුව පළාතේ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය***

2014.06.24 වන දින සභා සම්මත කරන ලදුව 2014.08.06 වන දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලද 2014 අංක 02 දරන සබරගමුව පළාතේ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය නම් වූ මෙම ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

ලලිත් දොඩම්කොටුව,<br>
සභා ලේකම්,<br>
සබරගමුව පළාතේ පළාත් සභාව.

2014 සැප්තැම්බර් මස 10 වැනි දින,<br>
සබරගමුව පළාතේ පළාත් සභාවේ දී ය.

*යෝජිත සබරගමුව පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්ති කෙටුම්පත*

**සබරගමුව පළාත් සභාවේ 2014 අංක 02 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය**

සබරගමුව පළාතේ සමුපකාර සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිහිටුවීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද, සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් විසින් එම යෝජනා ක්‍රමය සබරගමුව පළාතේ මෙහෙයවනු ලැබීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද, ඊට සම්බන්ධ වූ හෝ අනුෂාංගික වූ කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ ප්‍රඥප්තියකි.

සබරගමුව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. 2014 අංක 02 දරන සබරගමුව පළාතේ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන මෙය සබරගමුව පළාතේ පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

### *I* වන කොටස

**සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පිහිටුවීම**

සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පිහිටුවීම

02. I. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කිරීම සඳහා සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යනුවෙන් හඳුන්වනු ලබන යෝජනා ක්‍රමයක් පිහිටුවනු ලැබිය යුතුය.

**නීතිගත සංස්ථාවක් විය යුතු බව**

II. මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් ඇති නීතිගත සංස්ථාවක් විය යුතු අතර එහි නෛතික සංස්ථාගත තත්වයෙන් නඩු හෝ නීති කෘත්‍ය ඉදිරිපත් කිරීමට සහ නඩු සහ වෙනත් නීති කෘත්‍ය සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමටද මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා අවශ්‍ය සියළු දේ කිරීමට ද බලය ඇති නීතිගත සංස්ථාවක් බවට පත්වන්නේය.

**අධ්‍යක්ෂකවරයා පත් කිරීම**

03. I. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පරිපාලනය කිරීමේ කාර්යය සඳහා තත්කාලයේ සබරගමුව පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් ධූරය දරන තැනැත්තා යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂකවරයා වන්නේය.

**අධ්‍යක්ෂකවරයාගේ කාර්යභාරය**

II. අධ්‍යක්ෂකවරයා යෝජනා ක්‍රමයේ කටයුතු සහ කාර්යය අධීක්ෂණය කිරීම සහ පරිපාලනය කිරීම සම්බන්ධව වගකිව යුතුය.

**උපදේශක කමිටුව පත්කිරීම**

III. යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් වූ සියළුම කටයුතු පාලනය කිරීම සහ පරිපාලනය සම්බන්ධව අධ්‍යක්ෂකවරයාට උපදෙස් දීමේ හා නිර්දේශ ලබාදීමේ කාර්යය සඳහා පහත සඳහන් පරිදි හත් දෙනෙකුගෙන් සමන්විත උපදේශක කමිටුවක් සිටිය යුතුය. එම සාමාජිකයන් අතුරින් 3.IV වගන්තියේ (ඊ) වගන්තිය යටතේ දැක්වෙන සාමාජිකයින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු අතර සියළු සාමාජිකයින් සඳහා අමාත්‍යවරයා විසින් පත්වීමක් ලබාදිය යුතුය.

IV. උපදේශක කමිටුවට සාමාජිකයන් වශයෙන් :

- (අ) සබරගමුව පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්
- (ආ) සබරගමුව පළාතේ පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)
- (ඇ) කම්කරු කොමසාරිස් ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන එම දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙක්.
- (ඈ) සබරගමුව පළාතේ පළාත් සභාවේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්
- (ඉ) සීමාසහිත රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල වල සභාපතිවරු දෙදෙනා
- (ඊ) සබරගමුව පළාතේ පළාත් සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අවුරුදු 20 කට නොඅඩු සේවා පළපුරුද්දක් ඇති සේවයේ නියුතු හෝ විශ්‍රාමික හෝ නීත්‍යානුකූල පරීක්ෂණයකින් වරදකරුවෙකු නොවූ සබරගමුව පළාතේ සමුපකාර සමිතියක හෝ සංගමයක විධායක නිළධාරියෙක් (පත්කරනු ලැබිය යුතුය.)

**කාර්ය මණ්ඩලය**

V. උපදේශක කමිටුවේ තීරණය පරිදි සබරගමුව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගෙන් පමණක් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාර්යය මණ්ඩලය යොදවා ගත යුතුය.

**උපදේශක කමිටුවේ සාමාජිකයන්ගේ සුදුසුකම් හා ධූර කාලය**

04. I. (අ) මෙම ප්‍රඥප්තියේ 3.IV වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඉ) යන වගන්තිවල සඳහන් උපදේශක කමිටු සාමාජිකයන්ගේ ධූරකාලය එම නිළ තනතුරු දරන කාලයට සීමාවන්නේය.

(ආ) මෙම ප්‍රඥප්තියේ 3.IV වගන්තියේ (ඇ) වගන්තිය යටතේ පත්වන උපදේශක කමිටු සාමාජිකයා කම්කරු කොමසාරිස් ජනරාල්වරයාම වන විටදී එම අයගේ ධූර කාලය නිළ තනතුරු දරන කාලයට සීමා වන්නේය. කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් නම් කරනු ලබන එම දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙකු උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලබන්නේ නම් ඔහුගේ ධූර කාලය මිය යාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ ධූරය හිස් වුවහොත් මිස අවුරුදු 03 ක කාලපරිච්ඡේදයක් සඳහා විය යුතුය. එසේ වුවද කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් වෙනත් නිලධාරියෙකු නම් කිරීමෙන් මුලින් පත්කළ නිලධරියාගේ පත්වීම අහෝසි වන්නේය.

(ඇ) මෙම ප්‍රඥප්තියේ 3.IV වගන්තියේ (ඊ) යන වගන්තිය යටතේ උපදේශක කමිටුවට පත් කරනු ලබන සාමාජිකයෙකුගේ මිය යාමෙන් හෝ කවර හෝ අවස්ථාවකදී අමාත්‍යවරයා වෙත යවන ලිපියක් මගින් ඉල්ලා අස්වීමෙන් හෝ අමාත්‍යවරයා විසින් ඉවත් කරනු ලැබීමෙන් හෝ ධූරය හිස් වුවහොත් මිස අවුරුදු 03 ක කාල පරිච්ඡේදයක් සඳහා ධූරය දැරිය යුතුය.

II. උපදේශක කමිටුව 3.IV වගන්තියේ (ඊ) යන වගන්තිය යටතේ පත්කළ සාමාජිකයෙකු ඉහත දැක්වෙන පරිදි ධූරය හිස් කරන ලද අවස්ථාවක 03. III උප වගන්තියේ විධිවිධාන ගැන සැළකිලිමත්ව ඔහු වෙනුවට වෙනත් තැනැත්තෙකු පත්කළ යුතු අතර ඒ සාමාජිකයා තමා පත් කරනු ලැබීමට හේතු වූ අනුප්‍රාප්තිකයාගේ ඉතිරිව ඇති ධූර කාලය සඳහා ධූරය දැරිය යුතුය.

III. රෝගාතුර වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ උපදේශක කමිටුවට පත්කළ සාමාජිකයෙකුට තම කාර්යයන් ඉටු කිරීමට නොහැකි බව අනාවරණය වුවහොත් ඔහු වෙනුවට වැඩ ආවරණය කරනු ලබන තැනැත්තා වැඩ බැලීමට අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

IV. ධූරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයෙකු හැර ධූරය හිස් කරන උපදේශක කමිටුවේ යම් සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේය.

උපදේශක කමිටුවේ කාර්යයන්

05. උපදේශක කමිටුව විසින් පහත දැක්වෙන බලතල සියල්ල හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

I. මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම.

II. මෙම යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීමට, මෙහෙයවීමට සහ ක්‍රියාවේ යෙදවීමට අදාළ කරුණු පිළිබඳව අධ්‍යක්ෂකවරයාට උපදෙස් දීම.

III. මෙම යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු සමාලෝචනය කිරීම.

උපදේශක කමිටුවේ රැස්වීම

06. I. සමුපකාර විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයා උපදේශක කමිටුවේ සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතුය. උපදේශක කමිටුවේ යම් රැස්වීමකට ඔහු පැමිණ නොමැති විටක උපදේශක කමිටුවේ සාමාජිකයන් අතරින් පත්කරගනු ලබන අයෙකු රැස්වීමේ මූලාසනය දැරිය යුතුය.

II. අධ්‍යක්ෂවරයා උපදේශක කමිටුවේ ලේකම් වේ. ඔහු විසින් උපදේශක කමිටුවේ රැස්වීම් කැඳවිය යුතු අතර එම රැස්වීම මෙම ප්‍රඥප්තිය යටතේ යෝජනා ක්‍රමයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි අන්දමින් පවත්වනු ලැබිය යුතුය.

පුරප්පාඩු/පුරප්පාඩුව

III. උපදේශක කමිටුවේ පුරප්පාඩුවක් / පුරප්පාඩු පවතින අවස්ථාවකදී එකී උපදේශක කමිටුව විසින් ගනු ලබන තීරණ කිසිවක් එකී පුරප්පාඩුව හේතුවෙන් අවලංගු නොවේ.

ගණ පූර්ණය

IV. උපදේශක කමිටුවේ රැස්වීමක ගණ පූර්ණය අවම වශයෙන් සාමාජිකයන් හතර දෙනෙකු විය යුතුය.

අධ්‍යක්ෂකවරයාගේ උපදේශන කමිටුවේ සාමාජිකයන්ගේ හා කාර්ය මණ්ඩලයේ පාරිශ්‍රමිකය

07. I. අධ්‍යක්ෂකවරයා විසින් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ කාර්යය කිරීම වෙනුවෙන් අමාත්‍යවරයා තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය හැකිය.

II. උපදේශක කමිටුවේ රැස්වීම් වලට සහභාගී වීම වෙනුවෙන් උපදේශක කමිටුවේ සාමාජිකයින්ට අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව අධ්‍යක්ෂකවරයා විසින් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය හැකිය. උපදේශක කමිටුවේ අනුමැතිය ඇතිව උපදේශක කමිටුවේ කටයුතු වලට සම්බන්ධ කාර්යයන් සඳහා සාමාජිකයන් විසින් දරනු ලැබිය හැකි ගමන් හා වෙනත් වියදම් අධ්‍යක්ෂකවරයා විසින් ඒ සාමාජිකයින් වෙත ප්‍රතිපූර්ණය කළ යුතුය.

III. උපදේශක කමිටුව විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් වියදම් සේවයේ යොදවා ගන්නා අය වෙනුවෙන් ගෙවිය හැකිය.

## *II කොටස*

*සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම*

යෝජනා ක්‍රමයට බැඳීමට සුදුසුකම්

08. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරනු ලැබූ දිනට පෙර සේවයට බැඳී මේ දක්වා සේවයේ යෙදී සිටින වයසින් අවුරුදු 18 ට අඩු නොවූ සහ වයස අවුරුදු 60 දක්වා වූ ස්ථිර පත්වීමක් ලද සමුපකාර සේවකයෙකුට මෙම යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ඇත.

යෝජනා ක්‍රමයට අනිවාර්යයෙන් දායක විය යුතු බව

09. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරනු ලැබූ දින සිට ස්ථිර සේවයට බැඳෙන සමුපකාර සේවකයින් මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අනිවාර්යයෙන් දායක විය යුතුය.

යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ

10. I. මෙම යෝජනා ක්‍රමයට බැඳෙන්නාවූ (මෙහි මින්මතු දායකයා යනුවෙන් සඳහන් කරනු ලබන) සමුපකාර සේවකයෙකු නියෝග මගින් නියම කරනු ලබන පදනමක් මත මේ යෝජනා ක්‍රමය යටතේ පහත දැක්වෙන ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබිය යුතුය.

(අ) නියම කරනු ලැබිය හැකි පරිදි කාල පරිච්ඡේද අනුව විශ්‍රාම වැටුපක්.
(ආ) නියම කරනු ලැබිය හැකි පරිදි කාල පරිච්ඡේද අනුව මින්මතු පාරිතෝෂික නමින් දැක්වෙන මරණ පාරිතෝෂිකයක්.

II. දායකත්වයේ කාල සීමාව දායකයාගේ වයස සහ දායකයා විසින් ගෙවන ලද දායක මුදල් ප්‍රමාණය සැළකිල්ලට ගෙන විශ්‍රාම වැටුප හෝ මරණ පාරිතෝෂිකය හෝ ගෙවීමේ පදනම නියම කරනු ලැබිය යුතුය.

විශ්‍රාම වැටුප් ගෙවිය යුතු අවස්ථා

11. I. දායකයා තම වයස අවුරුදු 60 වූ විට විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතුය. එසේ වුවද තම දායක මුදල් ගෙවීම ආරම්භ කළ දායකයෙකු නියම කරනු ලබන ඔහුගේ මුළු දායක මුදල් ප්‍රමාණය ගෙවා සම්පූර්ණ වුවද විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලබනුයේ යෝජනා ක්‍රමය අනුමත වී මාස 06ක් ඉකුත් වීමෙන් පසුවය.

II. දායකයා මාසයේ කුමන දිනයක මිය ගියද එම මාසයේ අවසානය දක්වා විශ්‍රාම වැටුප් ගෙවනු ලැබිය යුතුය.

මරණ පාරිතෝෂිකය

12. තම විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ලැබීමට පෙර දිනයක දායකයා මියගිය විටෙක නියෝග වලින් නියම කරනු ලබන පදනම මත ජීවත්ව සිටින යැපෙන්නන් හට නියම කරනු ලබන මරණ පාරිතෝෂිකය ගෙවිය යුතුය.

13. I. තම විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලැබීමට පෙර දායකයෙකු තම සේවා යෝජකයා වූ සමුපකාර සමිතියට හෝ සංගමයට අලාභයක් සිදුකොට ඇති බව මෙම ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ අර්ථ දක්වා ඇති පරිදි සිදුකරනු ලබන නීත්‍යානුකුල පරීක්ෂණයකින් සනාථ වී තිබේ නම් මේ ප්‍රඥප්තිය යටතේ කිසිදු ප්‍රතිලාභ හිමිකමකට, විශ්‍රාම වැටුපකට හිමිකම් නොලැබිය යුතුය. එසේ වුවද සමිතියට හෝ සංගමයට සිදුකළ අලාභය ප්‍රතිපූර්ණය කොට යෝජනා ක්‍රමයේ රැඳී සිටීමට නියම කරනු ලබන නියෝග අනුව හා 14 වන වගන්තියේ විධිවිධාන අනුව දායකයාට හිමිකම් තිබිය යුතුය.

විශ්‍රාම වැටුපකට හිමිකම් නොලැබීම

II. (අ) යම් දායකයෙකු සේවයෙන් විශ්‍රාම ගන්නා අවස්ථාවේදී සිය සේවා යෝජකයා වූ සමුපකාර සමිතියට හෝ සංගමයට අලාභයක් සිදුකොට ඔහුට එරෙහිව 13(1) ඡේදයේ සඳහන් පරිදි සිදුකරනු ලබන නීත්‍යානුකුල පරීක්ෂණයක් පැවැත්වේ නම් එම පරීක්ෂණය අවසන් වනතුරු ප්‍රඥප්තිය යටතේ ඒ දායකයාට ගෙවිය හැකි යම් විශ්‍රාම වැටුපක් තාවකාලිකව නතර කිරීමේ බලය අධ්‍යක්ෂවරයාට ඇත්තේය.

(ආ) 13.II (අ) යටතේ දායකයාට එරෙහිව පැවැත්වෙන නීත්‍යානුකුල පරීක්ෂණයක් මාස 06 කට වඩා ප්‍රමාද වුවහොත් උපදේශක කමිටුවේ අනුමැතිය ඇතිව විශ්‍රාම වැටුපෙන් කොටසක් හෝ සම්පූර්ණ විශ්‍රාම වැටුප හෝ දායකයාට ගෙවිය හැකිය.

(ඇ) ඉහත කී දායකයා වෙනුවෙන් කරනු ලබන නීත්‍යානුකුල පරීක්ෂණයේදී දායකයා නිදහස් වුවහොත් විශ්‍රාමගත් දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් ලැබීමට දායකයාට හිමිකම් ලැබිය යුතුවේ.

14. I. යම් සමුපකාර සේවකයෙකු යෝජනා ක්‍රමයේ දායකයෙකු ලෙස බඳවා ගනු ලැබූ විට අධ්‍යක්ෂවරයා විසින් දායකයා වෙත සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර එහි දායකයා විසින්, *එක් එක් දායකයා වෙත අධ්‍යක්ෂකවරයා විසින් සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු බව*

(අ) ගෙවනු ලැබිය යුතු දායක මුදල.

(ආ) සමුපකාර සමිතිය හෝ සංගමය විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල්.

(ඇ) සහතිකයේ නියමයන් හා කොන්දේසි.

(ඈ) දායකයා වෙත නිකුත් කරන ලද සහතිකය යටතේ දායකයාට හිමිවන ප්‍රතිලාභ සඳහන් කළ යුතුය.

II. දායකයෙකු විසින් වරින්වර හෝ අඛණ්ඩව කිසියම් දිනකට වාරික 3 ක් දායක මුදල් ගෙවීම පැහැර හැර ඇති විටෙක ඔහු වෙත නිකුත් කරන ලද සහතිකය යටතේ වූ ප්‍රතිලාභ අහිමි විය යුතුය.

III. යම් දායකයෙකු වෙත නිකුත් කර ඇති සහතිකය යටතේ ප්‍රතිලාභ යම් දායකයෙකු ට අහිමිවීමට ඇති අවස්ථාවක ඒ බවට දැන්වීමක් අධ්‍යක්ෂකවරයා විසින් එම දායකයා වෙත නිකුත් කරනු ලැබිය යුතුය.

IV. තම සහතිකය වලංගු කරවා ගැනීම සඳහා අධ්‍යක්ෂවරයා වෙත අභියාචනයක් කිරීමේ අයිතිය නියෝග අනුව නියම කරන පිළිවෙලක් අනුව දායකයෙකුට තිබිය යුතු අතර වාරික ගෙවීමට අපොහොසත් වීමේ හේතු දායකයාට පාලනය කළ නොහැකි වූ විට ඒ බවට අධ්‍යක්ෂකවරයා සෑහීමකට පත් වුවහොත් අධ්‍යක්ෂකවරයා විසින් සහතිකය වලංගු කරනු ලැබිය යුතුය.

V. සහතිකයක් වලංගු කිරීමට අධ්‍යක්ෂකවරයා තීරණය කරන අවස්ථාවක වාරික මුදල් ගෙවිය යුත්තේ යම් දිනකට පෙරද ඒ දිනය දායකයා වෙත දැන්විය යුතුය. එදිනට පෙර එකී දායක මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් ඔහුගේ සහතිකය අවලංගු වූවා සේ සැළකිය යුතුය.

15. නියෝග මගින් නියම කරනු ලබන නියමයන් අනුව මේ යෝජනා ක්‍රමයේ දායක මුදල් දායකයා හා අදාළ සමුපකාර සමිතිය හෝ සංගමය විසින් ගෙවිය යුතුය. සමුපකාර සමිතියක හෝ සංගමයක සේවයේ නියුතු මෙම යෝජනා ක්‍රමයේ දායකයන් විසින් ගෙවනු ලබන දායක මුදල් සමිතිය හෝ සංගමය විසින් යෝජනා ක්‍රමය වෙත ප්‍රේෂණය කළ යුතුය. එම නියෝග අනුව දායක මුදල් ගෙවනු ලැබිය යුත්තේ යම් දිනකට පෙරද ඒ දිනය නිශ්චිත වශයෙන් දක්වා තිබිය යුතු අතර සමුපකාර සමිතියක් හෝ සංගමයක් දායක මුදල් ගෙවීම එහි නිශ්චිත දිනට ගෙවීම නොකරන්නේ නම් නියෝග අනුව නියම කරන දඩ මුදලකට යටත් විය යුතුය. *දායක මුදල්*

16. I. යම් සමුපකාර සමිතියක් හෝ සංගමයක් නීතිය අනුව ඈවර කිරීම සඳහා ලියාපදිංචිය අවලංගු කර ඇති විටක සමිතිය හෝ සංගමය හෝ ලියාපදිංචිය අවලංගු කරන දිනය දක්වා දායකයා මුදල් ගෙවා ඇත්තේ නම් නියෝග අනුව නියම කරන ආකාරයට විශ්‍රාම වැටුප් ගෙවිය යුතුය. *සමුපකාර සමිති හෝ සංගමය ඈවර කිරීම.*

II. යම් සමුපකාර සමිතියක් හෝ සංගමයක් හෝ නීතිය අනුව යම් සමුපකාර සමිතියක් හෝ සංගමයක් සමග ඒකාබද්ධ වන්නේ නම් හා යම් සමුපකාර සමිතියක් හෝ සංගමයක් හෝ නීතිය අනුව යම් සමුපකාර සමිති හෝ සංගම් වලට විභද්ධ වන්නේ නම් දායකයාට මෙම යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුපකට හිමිකම් අහිමි වීමක් සේ නොසැළකිය යුතු අතර නව සේවා යෝජක සමිතිය හෝ සංගමය හෝ මගින් යෝජනා ක්‍රමයේ දායකයා රැඳී සිටියැයි තේරුම් ගත යුතුය. *ඒකාබද්ධ කිරීම, විභද්ධ කිරීම මත විශ්‍රාම වැටුප් අහිමි නොවිය යුතු බව.*

17. නියෝග මගින් නියම කරනු ලබන නියමයන් අනුව යම් දායකයෙකුට යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ප්‍රදානය කිරීම අධ්‍යක්ෂකවරයා විසින් තීරණය කරනු ලැබිය යුතුය. *ප්‍රතිලාභ ප්‍රදානය අධ්‍යක්ෂකවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු බව*

18. I. අධ්‍යක්ෂකවරයාගේ තීරණය පිළිබඳව අතෘප්තියට පත් යම් දායකයෙකුට අභියාචනා කිරීම සඳහා මතු සඳහන් පරිදි පස් දෙනෙකුගෙන් සමන්විත අභියාචනා මණ්ඩලයක් ගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලැබිය යුතුය.

II. අභියාචනා මණ්ඩලයේ සාමාජිකයන් පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතුය. *අභියාචනා මණ්ඩලය*

*අභියාචනා මණ්ඩලයේ සංයුතිය*

(අ) සබරගමුව පළාතේ පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)

(ආ) සබරගමුව පළාතේ පළාත් සභාවේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්.

(ඇ) අමාත්‍යවරයා විසින් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විමසා පත්කරනු ලබන කම්කරු දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙකු

(ඈ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අවුරුදු 20 කට නොඅඩු සේවා කාලයක් ඇති නීත්‍යානුකූල පරීක්ෂණයකින් වරදකරුවකු නොවූ සබරගමුව පළාතේ සමුපකාර සමිතියක හෝ සංගමයක හෝ සේවයේ නියුතු විධායක නිලධාරීන් දෙදෙනෙකු (ඇ. ඈ වගන්තිය යටතේ පත්කරනු ලබන සාමාජිකයන් උපදේශක කමිටුවේ සාමාජිකයින් නොවිය යුතුය.)

ගණ පූර්ණය

III. අභියාචනා මණ්ඩලයේ රැස්වීම්වල ගණපූර්ණය සාමාජිකයන් තිදෙනෙකු විය යුතුය.

දින 30ක් ඇතුළත අභියාචනා කළ යුතු බව

IV. අධ්‍යක්ෂකගේ තීරණයක් සම්බන්ධයෙන් සෑහීමකට පත්නොවූ යම් දායකයෙකුට අධ්‍යක්ෂකගේ තීරණය ලැබී දින 30 ක් ඇතුළත දී තම අභියාචනයට හේතු සඳහන් කරමින් අභියාචනා මණ්ඩලය වෙත අභියාචනයක් කරනු ලැබිය හැකිය.

දින 90 ක් තුළ අභියාචනා තීරණය ලබාදිය යුතු බව

V. අභියාචනයක් ලැබී දින 90ක් තුළ අභියාචනා මණ්ඩලයේ තීරණය අභියාචක වෙත දැන්විය යුතුය.

VI. එවැනි අභියාචනයක් පිළිබඳව අභියාචනා මණ්ඩලයේ තීරණය අවසානාත්මක හා බලාත්මක විය යුතුය.

විශ්‍රාම වැටුප, දීමනාව, පාරිතෝෂිකය පවරා දීම හෝ ඉන් අයකර ගැනීම හෝ නොකළ යුතු බව.

19. යෝජනා ක්‍රමයෙන් ගෙවනු ලැබිය හැකි කිසිම විශ්‍රාම වැටුපක් පාරිතෝෂිකයක් හෝ දීමනාවක් පවරා දීම හෝ අන්සතු කිරීම හෝ නොකළ යුතු අතර සෑම පවරා දීමක් හෝ අන්සතු කිරීමක් හෝ සම්පූර්ණයෙන්ම ශුන්‍ය අවලංගු හා බල රහිත වන්නේය. මෙම ප්‍රඥප්තිය යටතේ හෝ මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන නියෝග යටතේ හෝ අධ්‍යක්ෂකවරයාට පැවරී ඇති බලතල යටතේ හැර වෙනත් පාර්ශවයකට විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ දීමනාවක් හෝ ගෙවනු ලැබිය යුතු තැනැත්තාගෙන් ලැබිය යුතු යම් ණයක් හෝ ගෙවීමක් හෝ සම්බන්ධයෙන් එවැනි විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් හෝ දීමනාවක් හෝ තහනම් කිරීමක් හෝ රිට් ආඥා ක්‍රියාත්මක කිරීමෙන් අයකර ගැනීමක් හෝ කරනු නොලැබිය යුතුය.

### *III* කොටස

*සමුපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදල*

සමුපකාර සේවක විශ්‍රාම වටුප් අරමුදල

20. I. මෙහි මින්මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදල පිහිටුවනු ලැබිය යුතුය.

II. එම අරමුදල වෙත :

(අ) සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් කලින් කලට සබරගමුව පළාත් සමුපකාර අරමුදලින් අනුමත කරනු ලබන මුදල් ප්‍රමාණයන්.

(ආ) යෝජනා ක්‍රමය මෙහෙයවීම සඳහා සබරගමුව පළාතේ පළාත් සභාව විසින් කලින් කල සම්මත කරනු ලබන මුදල් ප්‍රමාණයන්.

(ඇ) මුදල් විෂයභාර පළාත් අමාත්‍යවරයා විසින් කලින් කල අධ්‍යක්ෂකවරයා වෙත අත්තිකාරම් වශයෙන් හෝ ස්ථිර ප්‍රදානයන් වශයෙන් දෙනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන්.

(ඈ) සමුපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් වාර්ෂිකව අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ලබාදෙන ප්‍රදානයන්.

(ඉ) යම් සමුපකාර සමිතියකින් හෝ සංගමයකින් හෝ වාර්ෂිකව හෝ කලින් කල දෙනු ලබන මුදල් ප්‍රමාණයන්.

(ඊ) මෙම ප්‍රඥප්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම පිණිස කාර්යයන් ඉටු කිරීමේදී සහ කර්තව්‍යන් කිරීමේදී ලැබෙන සියළුම මුදල් ප්‍රමාණයන්.

(උ) ත්‍යාග සහ ප්‍රදාන මාර්ගයෙන් යම් සම්භවයකින් ලැබෙන සියළුම මුදල් ප්‍රමාණයන්.

(ඌ) යෝජනා ක්‍රමයේ දායකයන් විසින් මාසික දායක මුදල් වශයෙන් යෝජනා ක්‍රමය වෙත ගෙවනු ලබන සියළුම මුදල් ප්‍රමාණයන් හා සමුපකාර සමිති හා සංගම් විසින් මාසිකව ගෙවනු ලබන දායක මුදල්.

(එ) යෝජනා ක්‍රමයට සේවකයෙකු ඇතුළත් වන අවස්ථාවේදී සේවකයා විසින් සහ සමිතිය හෝ සංගමය විසින් ගෙවනු ලබන ආරම්භක ගාස්තු ඇතුළත් මුදල් ප්‍රමාණයන්.

(ඒ) ආයෝජන වලින් පොළිය හෝ ලාභ හෝ වශයෙන් උපයා ගන්නා ලද සියළු මුදල් ප්‍රමාණයන්.

(ඔ) අරමුදල් වෙත ත්‍යාග හා ප්‍රදාන වශයෙන් යම් සම්භවයකින් ලැබෙන සියළු මුදල් හා මෙම යෝජනා ක්‍රමයේ කර්තව්‍යයන් කිරීමේදී අධ්‍යක්ෂකවරයා වෙත සමුපකාර සමිති වලින් හා සංගම් වලින් අත්තිකාරම් මාර්ගයෙන් දෙනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන්.

III. මෙම අරමුදලේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමක් පවත්වාගෙන යා යුතුය. අරමුදලට ලැබෙන සියළුම මුදල් මෙම ගිණුමට බැර කළ යුතුය.

IV. මෙම ප්‍රඥප්තිය යටතේ උපදේශක කමිටුවේ හා අධ්‍යක්ෂකවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමේදී,

කාර්යයන් ඉටු කිරීමේදී සහ කර්තව්‍යයන් කිරීමේදී උපදේශක කමිටුව විසින් හෝ අධ්‍යක්ෂකවරයා විසින් හෝ දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය වන්නා වූ සියළු මුදල් ප්‍රමාණයන් ද මෙම ප්‍රඥප්තිය මගින් හෝ නියෝග යටතේ හෝ අරමුදලින් ගෙවිය යුතුවන මුදල් ප්‍රමාණයන්ද අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

V. මෙම අරමුදලේ සියළුම මුදල් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ගෙවීම සහ විශ්‍රාම වැටුප් අරමුදලට අදාළ කාර්යයන් වල වියදම් පියවීම හැර වෙනත් කිසිදු කාර්යයක් සඳහා භාවිතා නොකළ යුතුය.

21. මෙම ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂකවරයාට වහාම අවශ්‍ය නොවන්නා වූ අරමුදලේ සියළු මුදල් උපදේශක කමිටුවේ තීරණය අනුව අධ්‍යක්ෂකවරයා විසින් රාජ්‍ය බැංකුවක හෝ රාජ්‍ය මූල්‍ය ආයතනයක හෝ දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ ආයෝජනය කරනු ලැබිය යුතුය. මුදල් ආයෝජනය කිරීම.

22. අධ්‍යක්ෂකවරයා විසින් උපදේශක කමිටුවේ තීරණය ඇතිව අධ්‍යක්ෂකවරයාගේ බැඳීම ඉටු කිරිම සඳහා නැතහොත් මෙම ප්‍රඥප්තිය යටතේ යෝජනා ක්‍රමය ක්‍රියාවේ යෙදවීම සඳහා අධ්‍යක්ෂකවරයාට අවශ්‍ය වන්නා වූ මුදල් බැංකු අයිරා වශයෙන් හෝ අන් ලෙසකින් සමුපකාර සමිතියකින්, සංගමයකින්, රාජ්‍ය මූල්‍ය ආයතනයකින් ණයට ගැනීම හෝ කරනු ලැබිය හැකිය. මුදල් ණයට ගැනීමේ බලතල

23. I. යෝජනා ක්‍රමයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

II. අධ්‍යක්ෂකවරයා විසින් එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට පැවති ආකාරයට යෝජනා ක්‍රමයේ පොත් පත් තුලනය කිරීමට සලස්වනු ලැබිය යුතු අතර එකී දිනට ආදායම් හා වියදම් ගිණුමක් හා වත්කම් හා බැරකම් වල සාරාංශයක් අඩංගු ශේෂ පත්‍රයක් ඊළඟ වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර උපදේශක කමිටුවට ඉදිරිපත් කළ යුතුය. මුදල් වර්ෂය ගිණුම්.

III. 23. II ජේදයේ සඳහන් තොරතුරු එම වර්ෂයේ ජුනි මස 30 දිනට පෙර පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාවට ගිණුම් ඉදිරිපත් කළයුතු බව.

IV. සෑම වර්ෂයකදීම යෝජනා ක්‍රමයේ ගිණුම් පළාත් සභාවේ විගණනය භාර නිලධාරියා විසින් හෝ නීතියට අනුකූලව විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතුය. ගිණුම් විගණනය

### *IV වන කොටස*

*වෙනත් කරුණු*

24. I. ඇතැම්විට නියම කෙරෙතැයි හෝ නියම කළයුතු යැයි මෙම ප්‍රඥප්තියේ සඳහන් කරුණු හා පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

- (අ) යෝජනා ක්‍රමය විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.
- (ආ) සමුපකාර සේවකයෙකු යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම් ලබන්නේ කවර සුදුසුකම්, කොන්දේසි සහ අවස්ථානුගත කරුණු ඇතිව සහ කවර සීමා කිරීම් යටතේ ද යන වග තීරණය කිරීම
- (ඇ) දායකයන් විසින් හා දායකයන් වෙනුවෙන් සමුපකාර සමිති, සංගම් විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදල් ප්‍රමාණයන් තීරණය කිරීම.
- (ඈ) දායකයන් වෙත විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය හෝ දීමනා ගෙවිය යුතු පදනම තීරණය කිරීම.
- (ඉ) දායක මුදල් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් කොන්දේසි තීරණය කිරීම.
- (ඊ) උපදේශක කමිටුවේ කටයුතු පිළිබඳ කාර්ය පටිපාටි හා රීති සකස් කිරීම.
- (උ) අභියාචනා ක්‍රියාවලිය පිළිබඳ කාර්යය පටිපාටි හා රීති සකස් කිරීම.
- (ඌ) විශ්‍රාම වැටුප් හිමිකම් සහතිකය අවසන් කිරීම හෝ අහිමි කිරීම.
- (එ) මරණ පාරිතෝෂිකය ගෙවීමේ පදනම සහ ප්‍රමාණය තීරණය කිරීම.
- (ඒ) අදාළ ආකෘති නියම කිරීම.

II. අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළකළ යුතුය. එසේ පළ කරනු ලබන දිනයේ දී හෝ නියෝගවල සඳහන් පසු දිනයකදී එය ක්‍රියාත්මක විය යුතුය.

III. එවැනි සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු ලැබූ යම් නියෝගයක් ගැසට් පත්‍රයේ පළකළ යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ නියෝගය යටතේ කලින් කරන ලද කිසිවකට

හානියක් නොවන පරිදි ඒ අනුමත දින සිට පරිච්ජින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය. යම් නියෝගයක් එසේ පරිච්ජින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතුය.

මෙම ප්‍රඥප්තිය යටතේ හෝ අධ්‍යක්ෂකවරයාගේ නියෝග මත හෝ ගන්නා ලද පියවර සඳහා ආරක්ෂාව

25\. I. අධ්‍යක්ෂකවරයා හෝ උපදේශක කමිටුව, උපදේශක කමිටුවේ සාමාජිකයකුට හෝ අභියාචනා මණ්ඩලය හෝ විසින් මෙම ප්‍රඥප්තිය යටතේ සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරයාට හෝ උපදේශන කමිටුවට, කමිටුවේ සාමාජිකයෙකුට හෝ අභියාචනා මණ්ඩලයට හෝ අභියාචනා මණ්ඩලයේ සාමාජිකයෙකුට හෝ

II. අධ්‍යක්ෂකවරයාගේ හෝ උපදේශන කමිටුවේ හෝ අභියාචනා මණ්ඩලයේ හෝ විධානයක් මත සද්භාවයෙන් කරන ලද හෝ එසේ අදහස් කරන ලද යම් ක්‍රියාවක් සඳහා හෝ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සහාය වන නිලධාරියෙකුට හෝ සේවකයෙකුට හෝ විරුද්ධව කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් හෝ පැවරීමට නොහැකි විය යුතුය.

දණ්ඩන

26\. මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝගයක් යම් විධානයක් හෝ කඩ කරන්නා වූ නැතහොත් ඒ අනුව කටයුතු කිරීම පැහැර හරින්නා වූ සෑම තැනැත්තෙකුම වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට මාස හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාර ගත කිරීමට හෝ රුපියල් 1500/- ක දඩයකට හෝ යන මේ දෙයාකාරයෙන් එක් ආකාරයක දඬුවමකට යටත් වීමක් කළ හැකිය.

අර්ථ නිරූපණය

27\. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියේ
"පළාත් සභාව" - යන්නෙන් සබරගමුව පළාතේ පළාත් සභාව අදහස් වේ.
"අමාත්‍යවරයා" - යන්නෙන් තත් කාලයේ සබරගමුව පළාතේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා වේ.
"සමුපකාර සමිතියක්" - යන්නෙන් 1992 අංක 11 දරන හා 1983 අංක 32 දරන සංශෝධන පනත් වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත යටතේ සහ සබරගමුව පළාත් සභාවේ සංශෝධන සමග කියැවෙන 1994 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය සහ 2007 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ සබරගමුව පළාතේ ලියාපදිංචි කළ සමුපකාර සමිතියක්/සංගමයක් අදහස් වේ.

"සමුපකාර සංගමයක්" - යන්නෙන් 1992 අංක 11 දරන හා 1983 අංක 32 දරන සංශෝධන පනත් වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත යටතේ සහ සබරගමුව පළාත් සභාවේ සංශෝධන සමග කියවෙන 1994 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ සහ 2007 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ සබරගමුව පළාතේ ලියාපදිංචි කළ සමුපකාර සමිති කීපයකින් සමන්විත ලියාපදිංචි කළ සමුපකාර සංගමයක් අදහස් වේ.

"සේවකයා" - යන්නෙන් 1992 අංක 51 දරන සංශෝධන පනත සමග කියවෙන 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව සමුපකාර සමිතියක/සංගමයක ස්ථිර පත්වීමක් ලද සේවකයෙක් සේවකයා යන්නෙන් අදහස් වේ.

"නීත්‍යානුකූල පරීක්ෂණයක්" - යන්නෙන් 1992 අංක 51 දරන සංශෝධිත පනත සමග කියවෙන 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ සිදුකරන ලද විධිමත් විනය පරීක්ෂණයක් / 1992 අංක 11 දරන හා 1983 අංක 32 දරන සංශෝධන පනත් වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ සහ සබරගමුව පළාත් සභාවේ සංශෝධන සමග කියවෙන 1994 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය සහ 2007 අංක 3 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ විධිවිධාන අනුව සිදුකරන ලද පරීක්ෂණයක් අදහස් වේ.

අනනුකූලතාව බලපැවැත්වීම

28\. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

09 - 1140

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.